# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 42/25—1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (22)/73.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

**වි. ගොපල්ලව,**
**ජනාධිපතිවරයා.**

**1973 ජනවාරි මස 15 වැනි දින,**
**කොළඹ දී ය.**

**නියෝගය**

ජාතික රාජ්‍ය සභාවේ කන්කසන්තුරෙයි මැතිවරණ කොට්ඨාසය සඳහා වූ පුරප්පාඩුව පිරවීම පිණිස වූ මැතිවරණය පැවැත්වීමේ කාර්යය සඳහා මන්ත්‍රී ධුරාපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීම, ඒ මැතිවරණ දිස්ත්‍රික්කය ඇතුළත් වන ප්‍රදේශයෙහි හෝ එහි යම් කොටසක මහාජන ආරක්ෂක ආඥාපනතේ II වැනි කොටස ක්‍රියාත්මක වන තාක් කල් සහ ඒ තාක් කල් පමණක් නොපැවැත්විය යුතු අතර, ඒ අනුව, 1972 නොවැම්බර් මස 1 වැනි දින අංක 31/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දැන්වීමෙහි ඒ ඡන්ද විමසීම සඳහා මන්ත්‍රී ධුරාපේක්ෂකයින්ගේ නාම යෝජනා කිරීමේ දිනය හා ස්ථානය නියම කොට තිබුණු කොටස සියළුම කාර්යයන් සඳහා බල රහිත ලෙස සැලකිය යුතුය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

26/65——කේ 18862—2,500 (72/12)